# පරිසර සංරක්ෂණයෙහිලා යිං - යැං සංකල්පයේ උපයෝගීතාව පිළිබඳ විමසුමක්

*පූජ්‍ය තාමරවැවේ පියරතන හිමි [1]*

මෙම පර්යේෂණයට පාදක වන පර්යේෂණ ගැටලුව වන්නේ පරිසර සංරක්ෂණයෙහිලා යිං - යැං සංකල්පයේ උපයෝගීතාව කෙබඳු ද පිළිබඳ ව ශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදුකිරීම යි. එය එක් අතකින් සමය අධ්‍යයනය ආදී විෂයන්ටත්, පරිසර කළමනාකරණ හා භූගෝලය වැනි විෂයයන්ටත් වැදගත් ය. එබැවින් මෙම පර්යේෂණය ක්ෂේත්‍රීය වැදගත්කමකින් ද යුතු ය. මෙය තුලනාත්මක හා විශ්ලේෂණාත්මක විධික්‍රම භාවිත කර ගනිමින් සිදු කළ ගුණාත්මක පර්යේෂණයකි. යිං - යැං සංකල්පය යනු ප්‍රතිවිරුද්ධ බලවේග එකින් එක සම්බන්ධ වී එකින් එක මත රඳා පවතින ආකාරය පැහැදිලි කිරීමට භාවිතා කරන චීන දාර්ශනික අදහසකි. සරලව කිවහොත් කළු පාටට සුදු නොමැතිව පැවතිය නො හැක. ආලෝකය නොමැතිව අඳුර ද, තාපය නොමැතිව සීතල ද යනාදී වශයෙන් යමකට වෙන් වෙන් ව පැවතිය නො හැක. යිං - යැං සංකල්පය අද්භූත හා සංකීර්ණ වන අතර ඒ පිළිබඳ නිශ්චිතව නිර්වචනය කළ නො හැක. එය කෙසේ වෙතත් යිං - යැං සහ තාඕවාදය අතර සම්බන්ධය අවිවාදිත ය. එක්කෝ එයින් විශ්වයේ ගලා යෑම සමග කටයුතු කරයි නැතහොත් සියලු දේ සමතුලිතව හා පිළිවෙළට තබාගන්නා ස්වභාවික පිළිවෙල පිටුපස ඇති බලය විශ්වාස කරයි. එය පැවැත්මේ සහ නැවැත්මේ පවතින මූලාශ්‍රයක් ලෙස සැලකේ. එය අක්‍රියත්වයකි. පරිසරයේ ඇති විවිධත්වයට හිස නැමීමකි. අසමතුලිත බවට අනුබල නො දීමකි. කොරෝනා වසංගත තත්ත්වය ආදී නූතන අභියෝග හමුවේ පවා මෙම සංකල්පය ප්‍රතික්ෂේප නො වුණි. විද්‍යාවාදී ලෝකය තාක්ෂණය සමග පරිසරය විනාශයට මුහුණ දෙයි. එය විමසීමට ගෙනා සංකල්පය තිරසරසංවර්ධනය යි. එය තාඕහි අනන්‍ය ආකාරයකින් ඉදිරිපත් ය. තාඕ යනු ස්වභාව දහම ම ය. මිනිසාගේ අමරණීයත්වය රැඳී පවතිනුයේ ද ස්වභාව දහම හා ඒකීභූත වීම තුළ ය. ස්වභාව දහමේ විකෘතිය මිනිසාට අහිතකර අන්දමින් බලපෑම තාඕ මගින් අවම කෙරේ. එහි සදාචාරය ස්වභාව දහම ආරක්ෂා කිරීම සඳහායි. මෙම සංකල්පවල පරිසරික වශයෙන් පවතින සමතුලිතතාවට අවශ්‍ය කරන සිද්ධාන්ත ඉස්මතු වේ. වර්ෂාව, සුළඟ, තාපය සතා සිවුපාවා ආදී සියලු දේ පිළිබඳ ව කල්පනා කළ යුත්තේ මෙනයිනි.

***ප්‍රමුඛ පදඃ*** චීන දර්ශනය, යිං - යැං සංකල්පය, සමතුලිතතාව, පරිසර සංරක්ෂණය, තාඕවාදයය

[1] ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. hpiyarathanathero1998@gmail.com